GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

10/11/2012

## මාධ්‍ය නිවේදනයයි

ශ්‍රී ලංකාව නිදහසින් වසර 40 කට පසු පලමුවරට 2006 දි රාජ්‍ය සේවා වැටුප් සම්බන්ධයෙන් ජාතික වැටුප් ප්‍රතිපත්තියක් රටට හඳුන්වා දෙන ලදි. මෙම කාර්යයේදි රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය පුරෝගාමි මෙහෙවරක් ඉටු කරන ලදි. මෙම ජාතික වැටුප් ප්‍රතිපත්ති සැම දියුණු රටකම රාජ්‍ය සේවයේ ගුණාත්මකභාවය පවත්වාගෙන යාම සඳහා උපයෝගි කර ගනි.

මේ අනුව 2006 දි ඇතිකල ජාතික වැටුප් ප්‍රතිපත්තිය තුල සමස්ත රාජ්‍ය සේවයම කාණ්ඩ හතරකට වර්ග කිරිම යහපත් ලක්ෂණයක් ලෙස දැකිය හැකි වුවද, එම කාණ්ඩ අතර අවම හා උපරිම වැටුප් අතර අනුපාතය 1:4ක් ලෙස පැවතිම දුර්වලතාවයක් විය.

මේ සම්බන්ධයෙන් රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය පසුගිය වසර 02 පුරාම මෙම 1:4 වැටුප් අනුපාතයේ ඇති අවාසිදායක තත්ත්වයන් පෙන්වා දෙමින් මෙය 1:12 ලෙස පුළුල් කිරිම රාජ්‍ය සේවයේ ගුණාත්මකභාවය ඉහල මට්ටමෙන් පවත්වා ගැනිම හා බුද්ධිමතුන් රාජ්‍ය සේවයේ රඳවා ගැනිම සඳහා අත්‍යාවශ්‍ය වන බව පෙන්වා දෙන ලදි. සමහර අවස්ථා වලදි ජාතික වැටුප් ප්‍රතිපත්තියට පටහැනි සුවිශේෂි කාණ්ඩ ලෙස තමන් වර්ග කර වැටුප් වැඩි කරන ලෙස ඉල්ලමින් කරන ලද ඉල්ලිම් හමුවේ රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය ඊට විරුද්ධ මතයක් දරමින් දිගින් දිගටම කියා සිටියේ සියළුම රාජ්‍ය සේවකයින්ගේ වැටුප් ජාතික වැටුප් ප්‍රතිපත්තිය තුලම සිටිමින් උපරිම හා අවම වැටුප් අනුපාතය 1:12 දක්වා පුළුල් කිරිම තුලින් වැටුප් වැඩි කල යුතු බවත් කිසිදු ආකාරයකින් ජාතික වැටුප් ප්‍රතිපත්තියට හානිවන පරිදි වැටුප් වැඩි කිරිම සඳහා සුවිශේෂි කාණ්ඩ ඇති කරමින් ජාතික වැටුප් ප්‍රතිපත්තියට හානි නොකල යුතු බවයි.

ජාතික වැටුප් ප්‍රතිපත්තිය රටතුල තිබිමත් එම ප්‍රතිපත්තිය තුල සිටිමින් සියළුම රාජ්‍ය සේවකයින්ගේ වැටුප් වැඩි කිරිමත් යන කාරණා තුල රටක රාජ්‍ය සේවය ශක්තිමත්වී ජනතාවට වඩාත් ඵලදායි සේවයක් ලබාදිය හැකි බව රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය තරයේ විශ්වාස කරයි.

මේ අනුව 2013 අය වැය මඟින් දැනට පවතින ජාතික වැටුප් ප්‍රතිපත්තිය තවදුරටත් පුළුල් කර එම රාජ්‍ය අංශය,අර්ධ රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය සියල්ල අනුගත වන පරිදි වැඩි දියුණු කර වඩා විද්‍යාත්මක පසුබිමක් තුල නිර්මාණය කිරිමට සැලසිමට කටයුතු යෙදිම අගය කරමු. එහිදි රාජ්‍ය අංශය තුල අදාල රාජ්‍ය සේවකයා කරන කාර්යභාරයේ සුවිශේෂි තාවය සලකා දැනට පවතින පරිදි කාණ්ඩ ගත කිරිම තවදුරටත් දියුණු කර උපරිම හා අවම වැටුප් අතර අනුපාතය 1:12 වැනි මට්ටමකට ගෙන ඒම සඳහා ඉදිරි දැක්මක් ඇතිව කටයුතු කිරිමට හැකි බව දනිමු. තවද කිසිදු කාණ්ඩයක් සුවිශේෂියයි සලකා වැටුප් තිරණය කිරිම වෙනුවට රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය විසින් දිගින් දිගටම කියා සිටින ලද ක්‍රමවේදය ඔස්සේ පුළුල් හා විදිමත් සාකච්ඡා මේ සම්බන්ධයෙන් ඇතිවිය යුතු බව අය වැය මඟින් ප්‍රකාශ විම අගය කරමු. ඒ අනුව සාධාරන කාලයක් තුල අවශ්‍යය කටයුතු නිමකර 2006 වර්ෂයේදි ඇතිවු ජාතික වැටුප් ප්‍රතිපත්තිය තවදුරටත් ශක්තිමත් කර නව වැටුප් ප්‍රතිපත්තියක් බිහිකිරිම සඳහා කටයුතු සිදුවේ යයි අප ඉතා විමසිල්ලෙන් බලා සිටිමු,

ස්තුතියි

වෛද්‍ය නලින් ආරියරත්න
සහකාර ලේකම්

වෛද්‍ය නලින් ආරියරත්න 0714800942
වෛද්‍ය නලින්ද හේරත් 0717876516
වෛද්‍ය නවින් ද සොයිසා 0718582444